# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2018 නොවැම්බර් මස 19 වන සඳුදා

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 (12 වන මහල) හි පිහිටි**
**බස්නාහිර පළාතේ පළාත් සභාවේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම**

පූ.භා. 09.44 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

**●පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ඉසුර දේවප්‍රිය | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ලලිත් වනිගරත්න | (බස්නාහිර පළාතේ මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු සුමිත් ලාල් මැන්දිස් | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු හෙක්ටර් බෙත්මගේ | (සභා නායකතුමා) |
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු චන්දන ජයකොඩි | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා
අනුරාධ විමලරත්න
අනුරුද්ධ ලේකම්ගේ
අසෝක රන්වල
අර්ෂාඩ් නිසාම්ඩීන්
ඇන්ටනී උපුල් රාජිත
ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්
ඊ.ඒ. නන්දන පත්මකුමාර
උදාර රත්නායක
උදේන විජේරත්න
උපාලි කොඩිකාර
උපාලි ගුණරත්න
උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ
එම්.එස්.එම්. රහීම්
එස්.ඒ. සමන්මලී සකලසූරිය මැතිනිය
එස්. කුහවර්දන්
එස්.එම්. සකාවුල්ලා
ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව
කාමල් කුරුප්පු
කිත්සිරි කහටපිටිය
කිත්සිරි මංචනායක
කීර්ති කාරියවසම්
කුරුසාමි කලන්කාඩි තේවර්
ක්‍රිෂාන්ත යෝගදාස් පංචරත්නම් රාම්
කේ.ඩී. අරුණ දීපාල්
කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය
ගුණසිරි ජයනාත්
ජගත් අංගගේ
ජගත් කුමාර
ජගත් පී. විතාන
ජනක කුරුප්පු
ජනක දීපාල් වැලිවත්ත
ජයන්ත ද සිල්වා
ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා
ඩෝල්ටන් ජානක සූරියබණ්ඩාර
තුවාන් ආමිත් මොහමඩ් අක්රම්
තෙබුවන පියනන්ද හිමි
නිමල් චන්ද්‍රරත්න
නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන
නිරෝෂන් පාදුක්ක
නිරෝෂා අතුකෝරල මැතිනිය
නිශාන්ත ශ්‍රී වර්ණසිංහ
නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු
පී.ආර්.පී. අබේගුණවර්ධන
පී.ඩී. අබේරත්න
ප්‍රදීප් උඳුගොඩ
ප්‍රදීප් පෙරේරා
බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන
මල්ෂා කුමාරණතුංග මැතිනිය
මහින්ද ජයසිංහ
මහේෂ් අල්මේදා
මංජුල බුද්ධදාස
මෙරිල් පෙරේරා
මොරිස් විජේරත්න
මොහොමඩ් ෆයිරූස්
මොහොමඩ් ෆායිස්
යූ.එල්.එන්.පී. උඩවෙල
රවීන්ද්‍ර යසස් කුමානායක
රවී විජේසේකර
රොජර් සෙනෙවිරත්න
රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්
රෝස් ප්‍රනාන්දු මෙනෙවිය
ලක්ෂ්මන් නිපුණ ආරච්චි
ලයනල් ජයසිංහ
ලලන්ත ගුණසේකර
ලලිත් එල්ලාවල
ලලිත් වර්ණකුමාර
සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය
සරත් පතිරණ
සහන් ප්‍රදීප්
සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා
සුනිල් ජයමිණි
සුනිල් වටගල
සුමිත් විජයමුණි ද සොයිසා
සුසාර දිනාල්
සුසිල් කිඳෙල්පිටිය
සෙනල් වෙල්ගම
ශිරන්ත අමරසේකර
හරිස්චන්ද්‍ර කොස්තා

**නොපැමිණීම :**

**ගරු මන්ත්‍රීවරු**

අමල් සිල්වා
ඇ. ශ්‍රීනාත් ම. පෙරේරා
ඉන්දික බණ්ඩාර
කොලන්නගේ වජිර පෙරේරා
ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා
චන්ද්‍රසෝම සරණලාල්
නව්සර් ෆව්සි
නිමල් ආර්. පීරිස්
රජිත හපුආරච්චිගේ
රන්දීර් රොද්‍රිගෝ
ලෙනාඩ් කරුණාරත්න
විජිත් ප්‍රියන්ත
සලෝචන ගමගේ
ශ්‍රීනාත් පෙරේරා

## 01. සභාපතිවරයාගේ නිවේදනය :

*i*

*"සභා ගර්භය තුළ ගරු මන්ත්‍රීවරුන්ගේ මේස මත සවි කරනු ලැබ ඇති මයික්‍රෆෝන හා පරිගණක එකම පද්ධතියක් හා සම්බන්ධව ක්‍රියාත්මක වන බවත්, එම උපකරණ භාවිතයේදී යම් අපහසුතාවයක් ඇති වුවහොත් ඒ පිළිබඳව සභා ලේකම්තුමාට හෝ කාර්ය මණ්ඩලය වෙත දැනුම් දීමක් කරන මෙන්ද, ගරු මන්ත්‍රීවරුන්ගේ පැමිණීම සලකුණු කිරීම සඳහා වන ඇඟිලි සලකුණු යන්ත්‍රද මෙම පද්ධතිය තුළ ක්‍රියාත්මක වන බවත් එම ඇඟිලි සලකුණු යන්ත්‍ර සඳහා තම ඇඟිලි සලකුණ ලබා දී ලියාපදිංචි වන ලෙසත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

*ii*

*"නියෝජන ක්‍රමයේ හා නියෝජනයේ පවතින අභියෝග පිළිබඳ සංවාද මණ්ඩලය මාතෘකාව යටතේ විවෘත සංවාදයක් පැවැත්වීමට නියමිත බවත්, ඒ සඳහා බස්නාහිර පළාත් සභාවේ නියෝජිතයන් සහභාගී කරවන ලෙසට ඉල්ලා සිටින බවත්, සහභාගීත්වය පිළිබඳව පූර්ව දැනුම් දීමක් කරන ලෙසට ඉල්ලා කැලණිය විශ්ව විද්‍යාලයේ දේශපාලන විද්‍යා අධ්‍යයන අංශයේ අංශාධිපති විසින් 2018.10.18 දිනැතිව ලිපියක් ඉදිරිපත් කර ඇති බවත්, එම සංවාද මණ්ඩපය සඳහා සහභාගීවීමට අපේක්ෂා කරන්නේ නම් ඒ පිළිබඳව සභා ලේකම්තුමා විමසන ලෙසත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

*iii*

*"ගරු පළාත් සභා මන්ත්‍රීවරුන් හට බැංකුවලින් ණය හා අයිරා පහසුකම් ලබා ගැනීමට අවස්ථාව ඇහිරෙන පරිදි චක්‍රලේඛ නිකුත් කර ඇති බවත්, එමගින් ගරු පළාත් සභා මන්ත්‍රීවරුන් හට විශාල අපහසුතාවයකට මුහුණ පෑමට සිදු වන බවත් සඳහන් කරමින් උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා විසින් 2018.07.03 දින සභා රැස්වීමේදී මතු කරන ලද වරප්‍රසාද ප්‍රශ්නය මගින් ඉදිරිපත් කළ කරුණු පිළිබඳව මාගේ උපදෙස් මත සභා ලේකම්තුමා විසින් මුදල් අමාත්‍යාංශ ලේකම්ගෙන් විසීමක් කර ඇති බවත්, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කර ඇති එම ලිපියට පිළිතුරු වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ වැඩ බලන බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් එවා ඇති 2018.10.23 දිනැති ලිපිය මගින් ගරු පළාත් සභා මන්ත්‍රීවරුන් හට බැංකුවලින් ණය සහ අයිරා පහසුකම් ලබා ගැනීම අවහිර වන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් චක්‍රලේඛ නිකුත් කර නොමැති බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

*iv*

*"සභා රැස්වීම් දිනවලදී මහජන ගැලරිය සඳහා අමුත්තන් සහභාගී කරවීම සඳහා ගරු මන්ත්‍රීවරුන් විසින් අමුත්තන්ව නම් කිරීමේදී අවම වශයෙන් සභා රැස්වීම් දින දෙකකට පෙර එම නම් කිරීම් ගරු සභාපතිතුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු බවට 2018.11.07 දින පැවැති සභා කටයුතු කාරක සභා රැස්වීමේදී තීරණය කරන ලද බවත්, ඒ අනුව ගරු මන්ත්‍රීවරයෙකු විසින් කරනු ලබන නම් කිරීම අදාළ පරිදි ගරු ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායකතුමා හෝ ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා මගින් සභා රැස්වීම් දිනට දින දෙකකට පෙර ඉදිරිපත් කරන මෙන් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

*v*

*"අද දින සභා රැස්වීමේ පටන් ගරු මන්ත්‍රීවරුන්ගේ භෝජනාගාරය 12 වන මහලේ ස්ථාපනය කර ඇති බවත්, ගරු මන්ත්‍රීවරුන්ගේ රියදුරු කාර්ය මණ්ඩලය සඳහා ආහාර පාර්සල් නිකුත් කිරීම පැරණි සභා ශාලාව පිහිටි යාබද ගොඩනැගිල්ලේ බිම් මහලේදී නිකුත් කරනු ලබන බවත්, ගරු මන්ත්‍රීවරුන්ගේ භෝජනාගාරය භාවිතා කළ හැක්කේ ගරු මන්ත්‍රීවරුන් හා ගරු සභාපතිතුමාගේ අවසර ලත් විශේෂිත අමුත්තන් සඳහා පමණක් වන බැවින් එම භෝජනාගාරය තුළට බාහිර පුද්ගලයන් කැටුව යාමෙන් වළකින් මෙන් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

*vi*

*"අද දින මෙම අභිනව සභා ශාලාවේ පැවැත්වෙන ප්‍රථම පළාත් සභා රැස්වීම බැවින් ඇතැම් විට ගරු මන්ත්‍රීවරුන් වෙත ඇතැම් තාක්ෂණික උපාංග මෙහෙයවීම නුහුරු බවක් ඇති වීම ස්වභාවික තත්ත්වයක් බවත්, ඒ පිළිබඳ අවශ්‍ය සහාය නොකඩවා කාර්ය මණ්ඩලය මගින් ලබා ගැනීමට හැකියාව තිබෙන බවත්, ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ හැසිරවීම පිළිබඳව උපදෙස් පත්‍රිකාවක් ද මේසය මත තබා ඇති අතර, ඒවාද පරිශීලනය කර ක්‍රමානුකූලව මෙම තාක්ෂණික උපකරණ පහසුකම් ලබා ගැනීමට උත්සාහ කරන මෙන්ද, ඉතා ඉක්මණින් මෙම සභා ශාලාවේ මෙම සභා රැස්වීම පැවැත්වීමට කටයුතු කළ හෙයින් ඇතැම් විට ඇතැම් පහසුකම් ලබා ගැනීමට නොහැකි වුවත් ඉදිරියේදී ඒ සියල්ල ඉටු කර දීමට උත්සාහ කරන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

*vii*

*"අද දින සභා ශාලාවේ පවතින ආසන සැලැස්ම නිසාත්, ගරු මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකුගේ ඉල්ලීම මත ආසන වෙනස්වීම නිසාත්, තාවකාලිකව අද දින පනවා ඇති ඇතැම් ආසනවල සුළු වෙනස්වීමක් දැනෙන්නට හැකි බවත්, ඒ සම්බන්ධයෙන් කිසියම් අපහසුතාවයක්, නොගැළපීමක් යම් ගරු මන්ත්‍රීවරයෙකුට ඇති වී නම් ඒ බව තමාට හෝ සභා ලේකම්තුමාට ලිඛිතව දැනුම් දීමක් කරන මෙන්ද, එවිට සභා රීති ප්‍රකාරව ලබා දීමට හැකි සෑම සහනයක්ම ලබා දීමට කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

*viii*

*"අද දිනෙන් පසු එළැඹෙන ලබන මස පැවැත්වෙන සභා රැස්වීම් හී ප්‍රධාන කටයුත්ත වන්නේ වාර්ෂික මුදල් ප්‍රකාශය සම්බන්ධ කටයුතු හෙයින් එම දිනවල සභා රැස්වීම පෙ.ව. 09.00 ට ආරම්භ වන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

*viii*

*"අද දින සභා රැස්වීමේදී තාක්ෂණ අංශයෙන් සහාය දීම සඳහා අදාළ ආයතනයේ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණ ශිල්පීන් කිහිප දෙනෙකුට අවසර ලබා දුන් බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

## 02. කාරක සභා වාර්තා පිළිගැන්වීම :

2018.11.07 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමා විසින් පිළිගන්වන ලදී.

## 03. පළාත් සභාවේ රැස්වීම I :

සුමිත් ලාල් මැන්දිස් ගරු සභා කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"මෙතැන් පටන් එනම්, 2018.11.19 දින පටන් බස්නාහිර පළාතේ පළාත් සභාවේ සභා ශාලාව යනුවෙන් සඳහන් කරනු ලබන සියලු තැන්හිදී, ඉන් අදහස් කරනු ලබනුයේ බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා කාර්යාල පරිශ්‍රයේ නව ගොඩනැගිල්ලේ 12 වන මට්ටම (12 වන මහල) හි ස්ථාපිත මෙම අභිනව සභා ශාලාවම බවත්, බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් කැඳවනු ලබන රැස්වීමක් පිළිබඳව මෙන්ම පළාත් සභාව වෙනත් තීරණයක් ගන්නා අවස්ථාවකදී හැර අන් සියලු අවස්ථාවන්හිදී ඉහත කී සභා ශාලාව බස්නාහිර පළාතේ පළාත් සභාව රැස්වන ස්ථානය ලෙස සලසා කටයුතු කළ යුතු බවත්, මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි."*

## 04. පළාත් සභාවේ රැස්වීම II :

සුමිත් ලාල් මැන්දිස් ගරු සභා කටයුතු අමාත්‍යතුමා විසින් පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරන ලදී.

*"මෙම පළාත් සභාව වෙනත් තීරණයක් නොගන්නා තෙක්, 2018.10.23 හා 2018.11.07 දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී එකඟතාවය පළ කළ පරිදි 2018 නොවැම්බර් මස 19 වන දින, 2018 දෙසැම්බර් මස 04, 05, 06, 07, 10 හා 11 යන දිනයන් 2019 වර්ෂයේ මුදල් ප්‍රකාශය හා සම්බන්ධ වැඩ කටයුතු සඳහා වෙන් කළ දිනයන් විය යුතුය."*

***ඉහත යෝජනාව අනුව මුදල් ප්‍රකාශය සම්බන්ධ විවාද දිනයන් පිළිබඳව ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සලකා බැලීම සඳහා සභා කටයුතු කාරක සභාවට යොමු කිරීමට තීරණය කරන ලදී.***

## 05. පළාත් සභාවේ රැස්වීම III :

සුමිත් ලාල් මැන්දිස් ගරු සභා කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"මින් පෙර කිනම් තීරණයක් ගෙන තිබුණද, ඒ කිසිත් නොතකා අද දින (2018.11.19 දින) න්‍යාය පත්‍රයේ පොදු කටයුතු විෂයෙහි වැඩ කටයුතු සඳහා රීති අංක 49 (3) හි සඳහන් විධිවිධානයන්ගෙන් කිසිදු බාධාවක් සිදු නොවිය යුතු යැයි සලකා ක්‍රියා කළ යුතුය."*

## 06. පළාත් සභාවේ රැස්වීම IV :

සුමිත් ලාල් මැන්දිස් ගරු සභා කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"2019 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය හා ඒ හා සම්බන්ධ වැඩ කටයුතු සඳහා කාර්ය පටිපාටි රීති අංක 49 (5) හි සඳහන් කාල පරාසයන්ගෙන් කිනම් හෝ බාධාවක් සිදු නොවිය යුතුය."*

## 07. පළාත් සභාවේ කටයුතු :

සුමිත් ලාල් මැන්දිස් ගරු සභා කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"2018.11.07 දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී එකඟතාවය පළ කළ පරිදි, අද දින සභා රැස්වීමේ වැඩ කටයුතු සඳහා රීති අංක 15 (2) (ඇ) හා රීති අංක 15 (3) හි සඳහන් විධිවිධානයන්ගෙන් කිසිදු බාධාවක් සිදු නොවිය යුතු යැයි සලකා ක්‍රියා කළ යුතුය."*

## 08. 2018 පරිපූරක ඇස්තමේන්තුව - 03 :

ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරන ලදී.

*"2018 පරිපූරක ඇස්තමේන්තුව - 03[1] අනුමත කළ යුතුය."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

***ඉහත යෝජනාව සඳහා ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමා විසින් බෙදීමක් ඉල්ලා සිටි බැවින් පළාත් සභාව විරුද්ධව 02 යි, වැළකුණු 07 යි වූයෙන් බහුතරය පක්ෂව සිටින බැවින් 2018 පරිපූරක ඇස්තමේන්තුව සභා සම්මත බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***

---

[1] 2018.11.19 වන දින හැන්සාඩ් වාර්තාව බලන්න.

## 09. 2018 පරිපූරක ඇස්තමේන්තුව - 03 ට අදාළ විසර්ජන ප්‍රඥප්තිය:

ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"2018 වර්ෂයේ පරිපූරක ඇස්තමේන්තුව - 03 ට අදාළ විසර්ජන ප්‍රඥප්තිය[2] අනුමත කළ යුතුය."*

## 10. අපද්‍රව්‍ය කළමනාකරණ විශේෂ විධිවිධාන ප්‍රඥප්තිය : පළමුවන වර කියැවීම

ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් *"බස්නාහිර පළාතේ අපද්‍රව්‍ය කළමනාකරණ විශේෂ විධිවිධාන ප්‍රඥප්තිය"* පළමුවන වර කියැවීම සඳහා සභාවට ඉදිරිපත් කරන ලදී.

***අනතුරුව හේමන්ත සමරකෝන් මහතා [සභා ලේකම්] විසින්,***

***එහි පූර්විකාව වූ,***

*"බස්නාහිර පළාත තුළ අපද්‍රව්‍ය කළමනාකරණයට අදාළව බස්නාහිර පළාතේ 2007 අංක 1 දරන බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරී ප්‍රඥප්තියෙන් සංස්ථාපිත බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ක්‍රමෝපායන් පළාත් පාලන ආයතන මට්ටමින් බලගැන්වීම සඳහා ද පළාත් පාලන ආයතන විසින් එක්රැස් කළ යුතු වීථිවල තිබෙන අපද්‍රව්‍ය, නිවාසවල තිබෙන අපද්‍රව්‍ය නිසි හා යෝග්‍ය ක්‍රියාමාර්ග යටතේ බැහැර කිරීමට විධිවිධාන සැලැස්වීම සඳහා ද පළාත් පාලන ආයතන විසින් එක්රැස් කළ යුතු වීථිවල තිබෙන අපද්‍රව්‍ය, නිවාසවල එක්රැස් වන අපද්‍රව්‍ය හැර වෙනත් අපද්‍රව්‍ය පළාත් පාලන ආයතන විසින් භාර ගැනීම සම්බන්ධයෙන් මිලක් නියම කිරීම හා ප්‍රමිති තීරණය කිරීම සඳහා විධිවිධාන සැලසීමට ද බස්නාහිර පළාත තුළ අපද්‍රව්‍ය කළමනාරකණ අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමෝපායන් නියාමනය වෙනුවෙන් ගාස්තු නියම කිරීම සඳහා ද විධිවිධාන සැලසීම පිණිස පනවනු ලබන ප්‍රඥප්තියකි."*

***අනතුරුව, ප්‍රඥප්ති කෙටුම්පත ගරු සභාපතිතුමා විසින් ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරන ලදී.***

## 11. වාර්ෂික මුදල් ප්‍රකාශය : 2019 වසර

ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරන ලදී.

*"2019 වර්ෂය වෙනුවෙන් වූ මුදල් ප්‍රකාශය අනුමත කළ යුතුය."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

## 12. අයවැය කථාව :

අනතුරුව, පූ.භා. 11.32 ට ගරු ප්‍රධාන අමාත්‍යතුමා [ඉසුර දේවප්‍රිය මහතා] විසින් සිය අයවැය කථාව[3] ඉදිරිපත් කරන ලදී.

***අ.භා. 12.22 ට ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***

***අ.භා. 12.54 ට ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***

---

[2] 2018.11.19 වන දින හැන්සාඩ් වාර්තාව බලන්න.

## 13. **2019 වාර්ෂික මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය :**

ඉසුරු දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරන ලදී.

*"2019 වර්ෂය වෙනුවෙන් වූ මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතුය."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

## 14. **කල් තැබීමේ යෝජනාව :**

*"දැන් සභාව කල් තැබිය යුතු යැයි"* ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභා සම්මත විය.

***ඊට අනුකූලව, පළාත් සභාව අ.භා. 01.28 ට, 2018 දෙසැම්බර් මස 04 වන දින පූ.භා. 09.00 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2018.11.21
බස්නාහිර පළාතේ පළාත් සභාව,
11 වන මහල,
බස්නාහිර පළාත් සභා නව ගොඩනැගිලි සංකීර්ණය,
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
ශ්‍රී ජයවර්ධනපුර,
බත්තරමුල්ල.

පූර්/21
Minuts 2018.11.19 - Hansard Section

[3] 2018.11.19 වන දින නිල වාර්තාව බලන්න.